# පණුවන් 12 කට ඩොලර් 1-1/2 ක්

**දහසක් මල්**

වතුරයි, ලී කුඩුයි. නැත්නම් පසුයි දපු ප්‍රාව් පෙට්ටියක් ඇතුළෙ දගලන නලියන ගැඩවිලි පණුවො ගොඩක් දක්කොත් අපිට නම් ඔක්කාරෙට එන්නත් පුළුවනි, මේ මොන සැත ජරාවක්ද කියල. ඒත් පිලිපීනයේ අගනුවර වන මැනිලාවල සාන් ජුවාන් ප්‍රදේශයේ වෙළඳ හලක මේ වගේ පණුවන් ගෙන් පිරුණ පෙට්ටි දහක් විතර එක උඩ එක පටවල තියනව. 'පණු ලෝකය' යනුවෙන් නම් කර ඇති පණුවන් ඇති කරන මේ වෙළඳ ව්‍යාපාර යේ උප සභාපති මැනි කැටලන් කියන්නෙ 'මම නම් පණුවන්ගෙන් සෑහෙන මුදලක් හොයා ගන්නව. ඇයි අනෙක් අයටත් පණුවන් ඇති කරන්න බැරි' කියලයි.

කටු වලින් නිපදවන සත්ව ආහාරවල ඇති ප්‍රෝටීන් ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් මේ අනුව පණුවන් ගෙන් ලබා ගැනීමට පුළුවනි.

**පණුවන් ඇති කරන එක අමාරු වැඩක් ද ?**

නැහැ. පණුවන්ට කන්න දෙන්න කිසිම කරදරයක් වෙන්න ඕනෑ නැහැ. තායිවානයේ ජාතික විශ්ව විද්‍යාලයේ වාර්තාවකට අනුව පණුවො ලක්ෂ 200 කට දිනකට ගොහොදු මඩ මෙට්‍රික් ටොන් 80 ක් කා දමන්න පුළුවනි. රබර් සහ ප්ලාස්ටික් හැර ඕනෑම දෙයක් ඔවුන් ගිල දමනවා

පණුවො නොයෙකුත් වර්ග ඉන්නව. ඒ ඕනෑම ජාතියක් ඇති කරන්න පුළුවන් ද ?

> ජපානයේ අඩු ගණනෙ බෙහෙත් ජාති හතරක් සඳහා අවශ්‍ය සාරය ලබා ගන්නෙ පණුවන්ගෙන්. කුඩු කර ගත් පණුවො, බිස්කට්වලට, පාන්වලට සහ 'මැටෝ' යන ජපන් බීමට යොදගන්නව. – ඇමරිකාවෙ පණුවො ඇති කරන්නෙ ප්‍රධාන වශයෙන් බිලී බාන අයට ඇම හැටියට පාවිච්චි කිරීමටයි.

තායිවානයේ, ජපානයේ සහ කැනඩාවේ පණුවන් ඇති කිරීම සල්ලි ලක්ෂ ගණන් උපයන මාර්ගයක්. ඇමෙරිකා එක්සත් ජනපදයේ පණුවො ඇති කරන ව්‍යාපාරිකයො අවුරුද්දකට කෝටි ගණන් මුදල් උපයනව. පණුවන් ඉල්ලන අය ගේ සංඛ්‍යාව සියයට 20–30 දක්වා අවුරුදු පතා වැඩි වෙනවා.

**මොකට ද මේ පණුවො ඇති කරන්නෙ ?**

මසුන් මරන්නට ඇම හැටියට පාවිච්චි කිරීම පිණිස පණුවන් ඇතිකරන උතුරු ඇමෙරිකානු ගොවි සංගමයක සභාපති හැටියට කටයුතු කරන රොනල්ඩ් ට්. ගැඩ් කියන්නෙ පණුවන්ගෙන් මිනිසාටත්, මිනිස් පරිසරයටත් ලැබෙන ප්‍රයෝජන දින පතා වැඩිවෙමින් පවතින බව යි.

පණුවො හොඳ පෙන්ද්‍රිය පෝර ලබා දෙන මාර්ගයක්. ඔවුන් ඉවත් කරන මළ ද්‍රව්‍යවල ෆොස්පේට් සහ පොටෑෂ් ඇතුළත් වෙනවා. ගොහොදු මඩ ටොන් 1,000 ක් කෙටි කාලයක් තුළ පෙන්ද්‍රිය පෝර ටොන් 300 ක් බවට පත් කරන්න පණුවන්ට පුළුවන් යැයි ගණන් බලා තියෙනවා.

සත්ව ආහාර නිෂ්පාදනයේ දි පණුවන් හුඟක් ප්‍රයෝජනයට ගත හැකි යි. පණුවන් වේලුවාට පසුව දළ ප්‍රෝටීන් 70% ක් අඩංගු යැයි සොයා ගෙන තියෙනවා. සෝයා බෝංචි, මාළු සහ ඇට

ඇති කිරීමට උපයෝගී කර ගන්නෙ හෙලෝඩ්රිලස් ෆිටිඩස් කියන විද්‍යාත්මක නාමයෙන් හැඳින් වෙන පෝර පණුව සහ ලම්බ්‍රිකස් රුබෙලුස් යනුවෙන් හැඳින් වෙන රතු ගැඩවිලි පණුවයි.

**මේ පණුවන්ට කන්න දෙන්නෙ මොනවා ද ?**

ලී කුඩු සහ දහයියා වාගෙ දේවල්වලට වතුර දල පල් කළහම ඒවා කාලා ජීවත් වෙන්න පණුවන්ට පුළුවනි. ඒත් දවස් තුනකට සැරයක් වගේ පරණ පත්තර කෑලි, කුණු වුන එළවළු සහ පලතුරු කොම්පෝස්ට් පෝර යනාදිය දීමෙන් ඔවුන් තර කර ගන්න පිළිවන්. සහල්වල කුඩ්ඩ මේ අතින් ඉතාම වැදගත්.

පරණ ලී කැබලි වලින් හද ගන්න පෙට්ටිවල, දහයියා, ලී කුඩු ආදිය සමග වතුර යොද පණුකූඩු හද ගත හැකි යි. මේවා එක පිට එක තියන්න පුළුවන් නිසා එතරම් ඉඩකඩ අවශ්‍ය වෙන්නෙත් නැහැ. ගැඩවිල් පණුවො ඉතාමත් ඉක්මණින් බෝ වෙන ජාතියක්. හොඳට වැඩුණ පණුවො 1,000 කට අවුරුද්දකට පස්සෙ පණුවො 8,33,000 ක් බෝ කරන්න පුළුවනි. පිටරට යැවීම සඳහා විශාල වශයෙන් පණුවන් ඇති කරන්නෙකුට පණු පෙට්ටි ඒ විදිහටම යවන්න පුළුවනි. දැන් ඇමරිකාවේ මේ සඳහා ඉතාමත් වැඩි ඉල්ලුමක් තියෙනවා.

# මිනිස්සු! මිනිස්සු!! මිනිස්සු!!!

බස් ගාස්තු වැඩි වෙනවා, කන බොන දේවල් වල ගණන් වැඩි වෙනවා, බස්වල, රේල්ලුවල යන්න බැරි තරම් තද බදය, ඉස්පිරිතාලවල ඇඳන් යටත් ලෙඩ්ඩු. මේ සේරටම මුල වැඩි වන ජනගහණය නේද? මේ ජනගහණ ප්‍රශ්න ගැන ඔබ දන්න තරම මැන බලන්න.

| | | | |
|---|---|---|---|
| මුළු ලෝකෙම ජනගහණය | ... | ... | 4,21,90,00,000 යි. |
| ලංකාවෙ ජනගහණය | ... | ... | 1,45,30,000 යි. |

ලෝකය පුරා සෑම තත්පරයකටම දරුවන් 03 දෙනෙක් බිහි වෙනවා.
ලංකාවේ සෑම පැයකටම දරුවන් 31 දෙනෙක් බිහි වෙනවා.

ලංකාවෙ අපට තියෙන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1,62,12,480 යි.
මෙයින් වගා කරන්න පුළුවන් ඉඩම් ප්‍රමාණය අක්කර 64,80,000 යි.

මේ තියන මුළු බිම් ප්‍රමාණය, ලංකාවෙ ජනගහණය අනුව බෙදුපුවහම,

1901 දී එක්කෙනෙකුට ලැබුණ අක්කර 4.5 ක්,
1946 දී එක්කෙනෙකුට ලැබුණ අක්කර 2.4 ක්,
1980 දී එක්කෙනෙකුට ලැබෙන්නෙ අක්කර 1.1 ක් විතරයි.

දැන් තියෙන ඉඩකඩ ටිකේ මිනිස්සු හිරවෙලා

1901 දී ලංකාවෙ වර්ග සැතැප්මක් ඇතුළත මිනිස්සු 141 ක් ජීවත් වුනා.
1946 දී ලංකාවෙ වර්ග සැතැප්මක් ඇතුළත මිනිස්සු 263 ක් ජීවත් වුනා.
1980 දී ලංකාවෙ වර්ග සැතැප්මක් ඇතුළත මිනිස්සු 572 ක් ජීවත් වෙනවා.